

# ඇඳුන් සිහින

## හේමමාලා හේරත් ලියන නවකතාව

මහීකාගේ තොරතෝංචියක් නැති කථාවෙන් ගැලවෙනු සඳහා රිදීමා සිය නෙත් ඉවතට ගත්තේත්, කවුටරය අසල මුදල් ගෙවා අවසන් කළ තරුණයා හිස ඔසවා බැලුවේත් එක්විටමය. තද පහරක් හිසට වැදුණාක් මෙන් රිදීමා තිගැස්සී ගියාය. සියල්ල මොහොතකට නැවතිණි. ඊළඟ මොහොතේ ගැහෙන්නට පටන්ගත් හදවතේ කොණකින් නැග ආ සියුම් වේදනාවක් ඇගේ ගත පුරා පැරතිර ගියේය.

උතුරු ඉන්දියානුවකු සතු ෂව වර්ණයකින් යුත් උස්, සිහින් දේහධාරී තරුණයා, උරහිස දක්වා වූ තම කෙස් කළඹ ගෙල මුලට පීරා පෝනිටේලයක් සේ ගැට ගසා උන්නේය. එක් කණෙක වූ කුඩා කරාබුව තරු කැටයක් මෙන් දිළිසුණී. ඔහුගේ තියුණු නෙත් සඟලේ වූයේ ප්‍රශ්ණාර්ථයකි. මුවෙහී වූයේ සරදම් සිනහවකි. තමා හොඳින් දන්නා මොහු කවුද?

මහීකා, තමා කවුන්ටරය කරා ගෙනයනුත්, කෝපි කෝප්ප දෙකක් ඇණවුම් කරනුත් රිදීමා දුටුවේ සිහිනෙන් මෙනි. කෝපි කෝප්පය ගත් ඇගේ දෑත සැලුණෝය.

"ඒක නම් නියම කථාවක් තමයි. මම එයාව හොඳට දන්නවා....
ඒත් මට එයාව මතක නෑ. ඕක නම් පුරාණ ආදර කථාවක් ...."

යළිත් අර වේදනාව හදවතේ කොණක ඉපිද ගතපුරා දිවයනු රිදීමාට දැනුණෝය. මුලින්ම තමාගේ නම ඇසූ වේලාවේ, මහීකා සිනා-වුයේද මෙලෙසය.

"රිදී ..... අපූරු නමක් " ඇය පැවසුවා රිදීමාට මතකය.

"අපූරුයි තමයි. ඒකේ තේරුම 'ආදරයෙන් පිරුණු' කියන එක ... " තමා ඇයට පැවසූ හැටිද රිදීමාට අද මෙන් මතකය.

රිදීමාගේ නිසල වත දුටු මහීකාගේ මුහුණද වෙනස් වුයේය.

"සොරි රිදී.... මම විහිළුවක් කළේ. අපි දවසක ඒ බෝයිව හොයාගන කථා කරලා බලමු. අඩු ගණනේ එයාටවත් මතක තියෙයිනේ ඔයාව මුණ ගැහුනේ කොහේදිද කියලා .... "

## අද ඇරඹෙන නව කතාව

"රිදී මොකද එකපාරට අමුතු වුණේ. ? ඒ මහීකාය. රිදීමා අපහසුවෙන් තම දෑස යෙහෙළිය වෙත යොමු කළාය.

"ඔයා දැක්කට දැන් ටිකකට කලින් අතන හිටපු බෝයි?"

"නෑ ඇයි?

එයාව මම හොඳට දන්නවා "

"ඉතින් ඔයාට කථා කරන්න තිබුණානේ"

මහීකාගේ ලෝකය ඉතා සරලය. ප්‍රශ්ණයක් ඇත්නම් ඊට පිළිතුරක් අත ළඟම ඇත.

"මම එයා හොඳට දන්නවා " රිදීමා මිමිණුවාය. "ඒත් මට මතක නැහැ මට එයා මුණගැහුනේ කොහේදි ද කියලා

මහීකාගේ කිකිණි සිනාහඬ පැතැරුණෝය. කීපදෙනෙක් හැරී, ඔවුන් දෙස බැලුහ.

සිසුන් දහස් ගණනක් ඉන්නා ඕස්ට්‍රේලියාවේ , මෙල්බර්න් නුවර ප්‍රසිද්ධ විශ්ව විද්‍යාලයක හදිසියේ වරක් දුටු තරුණයකු සෙවීම, පිදුරු ගොඩ ඇති ඉදිකටුවක් සෙවීමට වඩා අමාරු බව ඈ නොකීවාය.

"අපි ජර්නලිස්ට්ලා වෙන්න පුරුදු වෙන අය, ඔය වගේ පොඩි රහස් පරීක්ෂක වැඩක් කරන එක මොකක්ද?"

හිටිහැටියේ ධාරාණිපාත වැස්සක් කඩා-වැටුනේ ඔවුන්, මහීකාගේ කාරය වෙත දිව යද්දීය. ගිම්හාන කාලයේ සෙල්සියස් අංශය හතලිහ පමණ දක්වා ඉහළ යන දරාගත නොහැකි උෂ්ණත්වය, හිටි ගමන් පහළ බැස්සේ මෙවැනි කෙටි වැහි නිසාය. කාරයට නගිද්දී දෙදෙනාම උන්නේ තෙතබරි වීලාය. මහීකාගේ කබල් ටොයෝටා රථය එක්වරම ප්‍රාණවත්වීම ගැන ඈ දෙවියන්ට පින්දුන්නාය.

1

"ගුඩ් ගර්ල් .... " මහීකා රියේ සුක්කානමට තට්ටු කළාය. "මෙයා කවදාවත් මට කරදරයක් කරන්නේ නෑ "

රිදීමා හිනැසුණේ යාන්තමට ය. ගෙදරට කරදර කොට, ඩොලර් දෙදහස් පන්සීයකට ගත් කාරය අතරමග නතර වුවහොත් කරදරයෙහි වැටෙන්නේ මහීකා පමණක් නොවේ. දැනටමත් එමගින් එහාට, මෙහාට යාමට පුරුදුව සිටින තමාත්ය.

විශ්ව විද්‍යාලයේ සිට නිවසට කීලෝ මීටර ගණනාවක් යායුතු විය. ඇද හැලෙන වැස්සේ

***ඒ මුවගට නැගුණු සිනාවෙහි සරදමක් වුයේ, ඔහු පමණක් දන්නා තමා නොදන්නා රහසක් ඔහු දූන සිටි නිසාද?***

සැරට පාර හරියට පෙනුණෝත් නැත. පාර දෙපස එකතු වූ වැහි වතුර, සැඩ පහරක් සේ ගලා බසිනු කාරයේ ලයිට් එළියෙන් රිදීමා දුටුවාය. වේගයෙන් වැඩ කළ දුප්පත් වයිපරයේ හඬ සිත මෝහනය කරන්නාක් බඳු විය. දිව යන සැඩ පහර තමගේ ගතෙහි වෙලී, තමාද ඒ සමග ඇදගෙන යන බවත් රිදීමාට දැනුණෝය. තමාගේ සිරුර ගල් , මුල්වල හැපී සිරී යන බවත්,

"සුදු මැණිකේ .... "

යනුවෙන් කවුදෝ කෑගසන හඬක් ඇයට පැහැදිලිව ඇසුණෝය.

"රිදීමා .... රිදීමා ...." මහීකාගේ හඬින් ඈ අවදි වුවාය.

අපි ආවා

ඔවුන් වාසය කළේ සිංහල ජනතාව බහුල පෙදෙසකය. එහෙත් වාසනාවකට මෙන් ඔවුන්ගේ නිවස පිහිටා තිබුණේ, නගරයෙන් ඈතට වන්නට, පාළු පරිසරයක, විදී කොණකය. පැරණි උඩුමහල් නිවසක් වූ එහි, ඔවුන් සමග තවත් සිසුවියෝ දෙදෙනෙකු වුහ. එකම විද්‍යාලයක උගත් අය බැවින්, ඔවුන් අතර බලවත් එකමුතුකමක් තිබිණ.

"අමායි, රුචියි තාම ඇවිල්ලා නෑ වගේ ... " මහීකා යළිත් තෙපලාය. මම දුවලා ගිහින් ෂවර් එකක් අරගෙනම එන්නම්... "

රිදීමාද, ඇය සමඟින් උඩු මහලට නැගුණාය. එහි වූ කාමර තුනෙහි ඇයද, මහීකා ද, රුචිර-ාද වාසය කළෝය.පහළ තට්ටුවෙහි වූ නාන කාමරයක් සහිත ලොකු නිදන කාමරය අමා පාවිච්චි කළාය. වෛද්‍ය ශිෂ්‍යාවක වූ ඇය, නිවසෙහි කුලියෙන් හරි අඩක් පමණ ගෙවුවාය.

පොත් බෑගය මේසය මත අත්හල රිදීමා ඇඳට වැටුණේ මහන්සියෙනි. ඇය මේ රටට පැමිණ ගතව තිබුනේ මාසයකටත් අඩු කාලයකි. ඇගේ ලට්ට ලොට්ට තවමත් කාමරය පුරා පැතිර තිබුණෝය. ජනේලය අසල වූ පොත් රාක්කය හිස් වූ අතර, පොත් මිටි කිහිපයක් ඒ අසල බිම දක්නට ලැබිණ. ඇඳට උඩින් බිත්තියෙහි එල්වා තිබුණේ ක්‍රිෂ්ණා බටනලාව වයන, රාමු කරන ලද චිත්‍රයකි. එය කවුරුන් විසින් කවරද එහි එල්වූවක් දැයි අයට මතකයක් නොවීය. එහෙත් චිත්‍රයෙහි රාධාගේ අඩුව නම් ඇයට හොඳින්ම දැනුනේය.

ක්‍රිෂ්ණාගේ රුව දෙස නෙත් යොමා සිටි ඇගේ මනස යළිත් ඇදී ගියේ, සවස් වරුවෙහි තමා දුටු තරුණයා කෙරෙහිය. ඔහුගේ දෑසෙහි ප්‍රශ්ණාර්ථයක් වූයේ තමා ගල් ගැසුනාක් මෙන් ඔහු දෙස බලාසිටි නිසාවත්ද? ඒ මුවගට නැගුණු සිනාවෙහි සරදමක් වුයේ, ඔහු පමණක් දන්නා තමා නොදන්නා රහසක් ඔහු

